# දුක්ගැනවිලි නිරාකරණය හා උපදේශනය

<u>ලලාන් සමූහ ව්‍යාපාරය (ලලාන් රබර් ආයතනයන් හා සෙන්ට්‍රල් රබර් ආයතනය )</u>

බලාපොරොත්තු නොවූ යම්කිසි ඍණාත්මක සිදුවීමක් නිසා ඇතිවන මානසික පීඩාවක් දුක්ගැනවිල්ලක් වේ. මෙසේ හට ගන්නා දුක්ගැනවිලි ගැටුම්කාරී තත්වයක් දක්වා වර්ධනය විය හැකි බැවින් ඒ'වා නිසි පරිදි විසදා ගැනීම සිදුකල යුතුයි. අදාල ගැටලුව හොඳින් අවබෝධ කර ගැනීමෙන් පසුව පහත සදහන් ආකාරයට එය නිරාකරණය කරගත හැකිය.

අදාල අන්ශයේ සහය සුපරීක්ෂකවරයාට දැනුම් දීම.- හමු වී, ලිඛිතව හෝ දුරකථන මාර්ගයෙන් ඉදිරිපත් කළ හැක. (දුරකථන අංකය)

↓ නොවිසදේනම්

අදාල අන්ශයේ විධායකවරයාට දැනුම් දීම.- හමු වී, ලිඛිතව හෝ දුරකථන මාර්ගයෙන් ඉදිරිපත් කළ හැක. (දුරකථන අංකය)

↓ නොවිසදේනම්

මානව සම්පත් විධායකවරයාට දැනුම් දීම.- හමු වී, ලිඛිතව හෝ දුරකථන මාර්ගයෙන් ඉදිරිපත් කළ හැක. (දුරකථන අංකය)

↓ නොවිසදේනම්

කළමණාකාරතුමා හට දැනුම් දීම.- හමු වී, ලිඛිතව හෝ දුරකථන මාර්ගයෙන් ඉදිරිපත් කළ හැක. (දුරකථන අංකය)

↓ නොවිසදේනම්

**මානව සම්පත් හා පරිපාලන නිළධාරීතුමාට / නිළධාරීතුමියට දැනුම් දීම.** - හමු වී, ලිඛිතව හෝ දුරකථන මාර්ගයෙන් ඉදිරිපත් කළ හැක. (0114-311210)

↓ නොවිසදේනම්

**ප්‍රධාන විධායක නිළධාරීතුමාට දැනුම් දීම** - හමු වී, ලිඛිතව හෝ දුරකථන මාර්ගයෙන් ඉදිරිපත් කළ හැක. (0114-311202)

- කිසියම් ගැටළුවක් හෝ දුක්ගැනවිල්ලක් ඉදිරිපත් කිරීමේ සමාන්‍ය ක්‍රියා පිළිවෙත උක්ත අයුරින් වුවද කිසියම් සේවක මහත්මයකු / මහත්මියක හට තම ගැටළුව අවස්ථානෝචිත හා වඩා උචිත අයුරින් එම ධුරාවලියේ වඩා යෝග්‍ය පුද්ගලයා හෝ පුද්ගලයින් වෙත සෘජුවම ඉදිරිපත් කළ හැක. එහිදී ද පැමිණ මුණ ගැසී, ලිඛිතව හෝ දුරකථන මාර්ග යන විකල්ප සන්නිවේදන මාර්ග අතුරින් සේවක මහතා/ මහත්මියගේ අභිමතය පරිදි සන්නිවේදන මාර්ග/ය තෝරා ගත හැක.

- එසේ කිසියම් ගැටළුවක් හෝ දුක්ගැනවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි නම් ආපන ශාලාව,කාන්තා හා පිරිමි වැසිකිලි යන ස්ථාන වල තබා ඇති යෝජනා පෙට්ටි (suggestion Boxs) තුළට ඔබේ ගැටළුව ලිඛිතව ඉදිරිපත් කළ හැකිය.

- මෙම යෝජනා පෙට්ටි සතියේ සෑම සඳුදාවකම මානව සම්පත් අංශය විසින් විවෘත කරනු ලබන අතර එහි ඇති පොදු යෝජනා වලට විසඳුම් හා අදහස් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරනු ලැබේ.

**Signature (CEO):.....................................................................**    **Date: 21.06.2021**